# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2098/18 - 2018 නොවැම්බර් මස 21 වැනි බදාදා - 2018.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ගොනු අංකය :* GAL/LAN/ACQUIS/A13/35.
*ඉඩම් අමාත්‍යාංශ අංකය :* 4-3/9/2016/WS/187.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳුපිට පත්තුව උතුර සුළු කොට්ඨාසයේ, අංක 67 නාරංගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිටගල්දෙණිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද කෑ 3643 හා 2018.10.29 දිනැති මූලික පිඹුර අනුව මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0643ක් වූ ඉඩම් කොටස;

01. කැබලි අංක 01
ඉඩමේ නම: කුරුකොස්ගහමුල වත්ත සහ ගල්කැටියේ වත්ත; හිමිකම් කියන අය: ඊ.එම්.ඩී.ආර්.බී. හත්නාගොඩ, පිටගල්දෙනිය, කෑගල්ල; ප්‍රමාණය: හෙක්. 0.0378.

02. කැබලි අංක 02
ඉඩමේ නම: කුරුකොස්ගහමුල වත්ත සහ ගල්කැටියේ වත්ත; හිමිකම් කියන අය: ඊ.එම්.ඩී.ආර්.බී. හත්නාගොඩ, පිටගල්දෙනිය, කෑගල්ල; ප්‍රමාණය: හෙක්. 0.0265.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 දෙසැම්බර් මස 05 වැනි දින පෙ.ව. 10.00ට ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 නොවැම්බර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්.එම්.සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2018 නොවැම්බර් මස 16 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-60


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.